# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2294/45 – 2022 අගෝස්තු 25 වැනි බ්‍රහස්පතින්දා – 2022.08.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2019/78.

කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2019.11.28 දිනැති හා අංක 2151/51 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.11.21 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් කොළඹ 08, ලෙස්ලි රණගල මාවත, බන්ධනාගාර නිල නිවස, අංක 121/11 පදිංචි එස්. ප්‍රියානි මල්කාන්ති මර්තීනු මිය සහ බත්තරමුල්ල, කඩුවෙල පාර, අංක 475 හි පිහිටි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.06.16 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 අගෝස්තු මස 08 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 37332 – 18 (2022/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යොමු අංකය: IR/COM/03/2019/78

**කාර්මික අධිකරණයේ දී ය**

නඩු අංකය: A/123/2019

එස්. ප්‍රියානි මල්කාන්ති මර්තීනු මිය,
අංක 121/11, බන්ධනාගාර නිල නිවස,
ලෙස්ලි රණගල මාවත, කොළඹ 08.

පළමුවැනි පාර්ශවය

සහ

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,
අංක 475 කඩුවෙල පාර,
බත්තරමුල්ල.

දෙවන පාර්ශවය

අතර පවත්නා කාර්මික ආරවුල

පෙනී සිටීම

පළමු පාර්ශවය වෙනුවෙන් ඉල්ලුම්කාරිය එස්. ප්‍රියානි මල්කාන්ති මර්තීනු මහත්මිය නීතිඥ කේ. ඩී. සමන් ප්‍රියලාල් මහතා සමග දෙවන පාර්ශවය ආයතනය වෙනුවෙන් හසංක මොල්ලිගොඩ මහතා නීතිඥ රුවන්ත කුරේ මහතා සමග පෙනී සිටීම.

බලතල පැවරීම

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරණ පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අනපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල් බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ගාල්ල කොහොඹන් වත්ත, අංක 66/2A එච්. ආර්. එල්. සුගතදාස වන මා පත්කර ඇත.

**ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී ඇති කාරණය වනුයේ -**

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 1998.08.03 දින සිට VI වන ශ්‍රේණියේ උසාවි ලිපිකාරිණියක් ලෙස පත්වීම ලද එස්. ප්‍රියානි මල්කාන්ති මර්තීනු මහත්මිය වර්තමානය දක්වාම උසස්වීම් නොලබා සේවය කිරීම නිසා ඇයට අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුවී ඇත්නම් ඇයට හිමි විය යුතු සහන මොනවාද යන්න පිළිබඳ වේ. දෙපක්ෂය වෙත ආරවුලට හේතු වී ඇති කරුණු සම්බන්ධ විස්තර ඉදිරිපත් කරන ලෙස දෙන ලද දැනුම් දීම මත දෙපාර්ශවය විසින්ම විස්තර ඉදිරිපත් කිරීමෙන් පසු එම විස්තර ප්‍රකාශන දෙපාර්ශවය වෙත නැවත යවා ඇති අතර එයට දෙපාර්ශවය විසින්ම පිළිතුරු සපයා ඇත. ඒ අනුව 2020.07.23 දින නඩුව විභාග කිරීම ආරම්භ කරන ලදී.

නඩුව ආරම්භ කිරීමෙන් පසුව වගඋත්තර ආයතනයේ නීතිඥ මහතා මූලික විරොධතාවයක් ඉදිරිපත් කරයි. ඉල්ලුම්කාරිය මෙම අධිකරණය ඉදිරියේ සහන ඉල්ලා ඇත්තේ නීතියෙන් බල නොපවත්වන සහ නීතිය ඉදිරියේ කිසිම බලයක් නොමැති සහ නීතිය ඉදිරියේ දැනට වලංගු නොමැති බඳවා ගැනීම් පටිපාටියක් පදනම් කරගෙන බවය. ඒ මත මෙම ඉල්ලීම් ප්‍රතික්ෂේප කරන ලෙස ඉල්ලා සිටී. ඉල්ලුම්කාරියගේ ලිඛිත දේශන අනුව ඉල්ලුම්කාරිය සහන ඉල්ලා ඇත්තේ ආයතනයේ 1979 සිට ක්‍රියාත්මක වූ බඳවාගැනීම් පටිපාටියට අනුව දෙන ලද උසස්වීම් වල දී සිදුවූ අසාධාරණය සම්බන්ධවය. මෙම ආයතනයේ සියලු බඳවාගැනීමේ හා උසස් වීම් 1979 බඳවා ගැනීමේ පටිපාටියට අනුව සිදුකර ඇති අතර 2012.10.05 දින නව බඳවාගැනීමේ පටිපාටියක් අනුමත කරගෙන ඇත. එසේ තිබියදී 2019 වර්ෂයේ දී නියෝජ්‍ය අධ්‍යක්ෂක තනතුරු 10ක් 1979 බඳවා ගැනීමේ පටිපාටියට අනුව උසස්වීම් ලබාගෙන ඇත. ඉල්ලුම්කාරියගේ කරුණු දැක්වීම සහ ඉහත කරුණු අනුව මූලික විරෝධතාවය ප්‍රතික්ෂේප කරමි. ඉල්ලුම්කාරියගේ පාර්ශවයට නඩුව ආරම්භ කරන ලෙස උපදෙස් දුනිමි. ඒ අනුව ඉල්ලුම්කාරිය සිය නීතිඥ මහතා මගින් කරුණු ඉදිරිපත් කරයි.

විසඳිය යුතු ප්‍රශ්න

01. ඉල්ලුම්කාරිය උසස්වීම් සඳහා සුදුසුකම් ලබා තිබේ ද.?

02. උසස්වීම් සඳහා ඉල්ලුම්කාරිය සම්මුඛ පරීක්‍ෂණ වලට සහභාගී වූයේ ද.?

03. උසස්වීම් දීමේ දී ඉල්ලුම්කාරියට අසාධාරණයක් වී තිබේ ද?

04. ආයතනයේ 2012 සම්මත කරගත් බඳවාගැනීමේ පටිපාටියට අනුව ඉල්ලුම්කාරිය උසස්වීම් ලබා දීමට බාධාවක් තිබේ ද.?

05. ආයතනය උසස්වීම් ලබා දීමේ දී නීත්‍යානුකූල ක්‍රමවේදයක් අනුගමනය කර තිබේ ද.?

ඉල්ලුම්කාරිය 2019.12.23 දින සහ 2020.01.13 දිනැතිව ලිඛිත දේශන ඉදිරිපත් කර ඇති අතර 2020.07.23 දින අධිකරණයේ දී තම කරුණු ඉදිරිපත් කර ඇත. ඉල්ලුම්කාරිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මගින් පල කරන ලද පුවත්පත් දැන්වීම් මගින් ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇති අතර ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව 1998.08.03 දින සිට කොන්ත්‍රාත් පදනම මත උසාවි ලිපිකරු ලෙස පත්වීම් ලබා ඇත. (A2 ලේඛනය) වසරින් වසර සේවය දික්කිරීමෙන් පසු 2001.10.01 දින සිට VI ශ්‍රේණියේ උසාවි ලිපිකරු ලෙස පත් කර ඇත. 2004.04.30 දිනැති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂකගේ අත්සනින් යුතුව ඉදිරිපත් කර ඇති ලිපිය මගින් 2001.10.01 දින සිට VI වන ශ්‍රේණියේ උසාවි ලිපිකරු ලෙස ස්ථිර කර ඇත. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 1979 බඳවා ගැනීමේ පටිපාටිය අනුව 2007, 2009, 2010 වර්ෂ වල පැවැත් වූ V වන ශ්‍රේණියේ මාණ්ඩලික තනතුරු සඳහා පැවැත් වූ සම්මුඛ පරීක්‍ෂණයට පෙනී සිට ඇති බව සඳහන් කර ඇත. මෙම උසස් වීම් දීමේ දී තමන්ට වඩා ජ්‍යෙෂ්ඨත්වයෙන් අඩු එමෙන් ම නියමිත සුදුසුකම් නොමැති අයට V වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර තනතුර සහ IV වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්‍ෂක තනතුරු දී ඇති බවත් මේ පිළිබඳව තොරතුරු ඉල්ලුම්කාරිය 2019.12.23 දිනැති ලිඛිත දේශන වල 5, 7, 8, 9, 10 ඡේද මගින් ඉදිරිපත් කර ඇත. 2007 පත්වීම් දීමේ දී ජ්‍යෙෂ්ඨත්වයෙන් අඩු සහ සුදුසුකම්න් අඩු අයට උසස් වීම් දුන් බවත් එය තහවුරු කිරීමට 2022.01.28 වන දින නොතීසියක් මගින් X ලේඛනය ඉදිරිපත් කර ඇත. සාක්ෂි සටහන් වල 155, 156, 157 පිටු

X ලේඛනය අමුනා ඇත.

මේ සම්බන්ධව සෑම වර්ෂයකම ඉල්ලුම්කාරිය පාලන අධිකාරියෙන් විමසූ බවත් කිසිදු අවස්ථාවක අසාධාරණය පිළිබඳ ක්‍රියා නොකර වසරින් වසර බලාපොරොත්තු තැබූ බවත්, සඳහන් කරන ඇය 2012 නව බඳවා ගැනීම් පටිපාටිය මත උසස්වීම් බලාපොරොත්තුව සිටි බවත් එම අවස්ථාවේ දී තමන් ට සාධාරණයක් නොවූ බව 2015 වර්ෂයේ දැනගත් බවත් ඒ අනුව 2017,2018 වර්ෂ වල එවක සභාපතිව සිටි අය වෙත අභියාචනා ඉදිරිපත් කළ බවත් සභාපතිගේ ලිඛිත උපදෙස් මතවත් විධායක අධ්‍යක්ෂක ක්‍රියා නොකරමින් (A-13,A-14) තමන්ට සහනයක් නොදුන් බව සඳහන් කර ඇත. 2018 වර්ෂයේ එවක සභාපති ඉල්ලුම්කාරියට සහකාර අධ්‍යක්‍ෂක (රාජකාරි ආවරණ) ලබා දෙන ලෙස ලිඛිතව දන්වා සිටිය දී විධායක අධ්‍යක්‍ෂක එයට ද ප්‍රතිචාර නොදක් වූ බවත් තමා තොරතුරු දැන ගැනීමේ පනත යටතේ කළ ඉල්ලීමට ආයතනය ක්‍රියා නොකළ බව ද සඳහන් කර ඇත. ඉල්ලුම්කාරිය තවදුරටත් ලිඛිත දේශන මගින් සහ සාක්ෂි මගින් තහවුරු කර සිටියේ 95, 96, 98 වර්ෂවල බඳවා ගත් 2007 වර්ෂයේ උසස් වීම් නොලැබූ වසර 10 ක සේවාකාලයක් ඇති VII වන ශ්‍රේණියේ සේවය කළ අයට වැටුප් වර්ධක 03 ක් සමග VI වන ශ්‍රේණියට අන්තර්ග්‍රහනය කළ බවත් එම අවස්ථාවේ දී වසර 10 නොමැති අය ද අන්තර්ග්‍රහනය කළ බවත් එහිදීද තමාට සාධාරණයක් ඉටු නොවූ බවත් සඳහන් කර ඇත. 2007 වර්ෂයේ කරන ලද උසස් වීම් 1979 බඳවා ගැනීම් පටිපාටියට පටහැනිව ලබා දුන් බව විගනන වාර්ථාවේ සඳහන් වන බව ද සඳහන් කළ ඉල්ලුම්කාරිය 2010 පැවති සම්මුඛ පරීක්‍ෂණයේ දී ඒ සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයෙන් සහභාගී වූ සමන් වඩුගේ නැමැති නිළධාරී මහත්මයා "1998 ඉඳන් ඉන්න නිසා කලින් උසස්වීමක් නොදුන්නේ ඇයි ?" පාලන අංශයෙන් විමසූ බවත් එවකට අංශ ප්‍රධානි මැඩම් "ඒ කාලේ නොසිටි බැවින් ඒ ගැන කියන්න දන්නේ නැහැ" කියූ බවත් සඳහන් කරයි. මේ සැරේ උසස් වීම් දෙන්න කියලා මම නිර්දේශ කරනවා කියලා සමන් වඩුගේ මහතා ප්‍රකාශ කළ බව ද ඇය තම සාක්‍ෂි සටහන් වල (62 පිටුව) සඳහන් කර ඇත. 2012 වර්ෂයේ තමන්ගේ වැටුප අනුව කළමනාකාර සහකාර MA/1 අන්තර්ග්‍රහනය කළ බවත් එය උසස් වීමක් නොවන බවත් සඳහන් කර ඇත.

වගඋත්තරකාර ආයතනය 2009.12.23 දින තම ලිඛිත දේශනය ඉදිරිපත් කරමින් අදල ඉල්ලුම්කාරිය 1998.08.02 සිට උසාවි ලිපිකරු ලෙස බඳවා ගත් බවද 2001.10.01 සිට VI ශ්‍රේණියේ උසාවි ලිපිකරු ලෙස ස්ථිර කළ බවද 2012 නව බඳවා ගැනීම් පටිපාටියට අනුව 2012.10.03 සිට අන්තර්ග්‍රහන ක්‍රියාවලිය අනුව කළමණාකාර සහකාර 1 ශ්‍රේණියට බඳවා ගත් බව සඳහන් කර ඇත. කළමණාකාර සහකාර ශ්‍රේණියට අන්තර්ග්‍රහනය කිරීම උසස්වීමක් බවද 2012 ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ බඳවා ගැනීම් පටිපාටියට අනුව ජ්‍යෙෂ්ඨත්වය හෝ තමන් ලබන වැටුප් ප්‍රමාණය සැලකීමෙන් උසස් වීම ලබා දෙන ක්‍රමවේදයක් නොමැති බව ද ඉල්ලුම්කාරියගේ ඉල්ලීම අනුව සහකාර අධ්‍යක්‍ෂක තනතුර ලබා දීමට නොහැකි බව සඳහන් කර ඇත. ඉල්ලුම්කාරියගේ ලිඛිත ප්‍රකාශනයන්ට වග උත්තරකාර ආයතනය 2012.01.30 දිනැතිව පිළිතුරු සපයා ඇත. එමගින් පත්වීමේ දින පිළිගෙන ඇති අතර 2007.05.23 දිනැති ලිපිය මගින් සුදුසුකම්ලත් අයගෙන් මාණ්ඩලික සහකාර V ශ්‍රේණිය සඳහා අයදුම්පත් කැඳවූ බවත් පැමිණිලිකාරිය අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති නිසා තෝරානොගත් බව සඳහන් කර ඇත. තවදුරටත් ඉල්ලුම්කාරියගේ ලිඛිත දේශනවල 5, 6, 7 ඡේද වලට පිළිතුරු සපයමින් වග උත්තරකරු 2007.05.23 දිනැති ඉඩම් ප්‍රතිසංස්කරණ සභාවේ ස්ථිර සේවකයින්ගේ උසස් වීම් ලබා දීම යන මැයින් යොමුකර ඇති ලිපිය අනුව සම්මුඛ පරීක්‍ෂණ මගින් තේරී පත්වූ නිළධාරීන්ට උසස් වීම් ලබා දුන් බව සඳහන් කර ඇත. ඉල්ලුම්කාරියගේ ලිඛිත දේශනවල 12 වෙනි වගන්තියට පිළිතුරු දෙමින් මාණ්ඩලික සහකාර තනතුරේ සේවයේ නියුතු නිළධාරීන් කිපදෙනෙකුට 2018 වර්ෂයේ සහකාර අධ්‍යක්‍ෂක විශේෂ ව්‍යාපෘති ලෙස තාවකාලිකව රාජකාරි ආවරණය කිරීම සඳහා පත්කළ බව ද එය වැඩ බැලීමේ පත්වීම් බව ද එමෙන් ම සහකාර අධ්‍යක්‍ෂක තනතුරේ සේවය නියුතු නිළධාරීන් කීපදෙනෙකුට 2018 වර්ෂයේ සහකාර අධ්‍යක්‍ෂක විශේෂ ව්‍යාපෘති ලෙස තාවකාලිකව රාජකාරී ආවරණය කිරීම සඳහා පත් කළ බවද ඉල්ලුම්කාරියට සහකාර අධ්‍යක්‍ෂක තනතුරට උසස්වීමක් ලබා දිය

නොහැකි බව ද සඳහන් කර ඇත.

2021.02.25 දින අධිකරණයේ දී කළමණාකාර මානව සම්පත් සංවර්ධන අංශයේ පරිපාලන නිළධාරී මොල්ලිගොඩ මහතා සාක්ෂි දී ඇත. එමගින් ඉල්ලුම්කාරියගේ පත්වීම සහ සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීම පිළිගෙන ඇත. ඉල්ලුම්කාරිය 2007,2009,2010 වර්ෂවල සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගී වූ බවත් 2007,2009 වර්ෂවල සම්මුඛ පරීක්ෂණ තොරතුරු ඉදිරිපත් නොවූ අතර 2010 වර්ෂයේ සම්මුඛ පරීක්ෂණයේ නාම ලේඛනයක් ඉදිරිපත් කරමින් ඇයගේ නම නාම ලේඛනයට ඇතුලත් වී නොමැති බව ප්‍රකාශ කළ අතර තහවුරු කිරීම සඳහා (V2, V3) ඉදිරිපත් කර ඇත. 2010 වර්ෂයේ අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර අභියාචනා කමිටුව විසින් සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල සංශෝධනයක් අවශ්‍ය නොවන බැවින් අභියාචනා සියල්ල ප්‍රත්ක්ෂේප කළ බව කියා සිටී. ඉල්ලුම්කාරියගේ ලිඛිත දේශනයේ 7 වන පිටුවේ සඳහන් අවසන් ඡේදයේ, ඉල්ලුම්කාරිය අධිකරණයෙන් කරන ලද ඉල්ලීම බල ශුන්‍ය ලේඛනයක් මත සහන ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීමක් බව කියා සිටී. ඉල්ලුම්කාරියගේ නීතිඥ මහතාගේ හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින්

ප්‍ර. ඒ අන්තර්ග්‍රහනය කිරීම හැර වෙනත් කිසිම ආකාරයට මේ අවුරුදු 24 තුළ ඇයට උසස් වීමක් ලැබිලා නැහැ ?
පි. ඔව්. ඒ අනුව උසස්වීමක් ලැබී නොමැත.(124 පිටුව)

තවදුරටත් වගඋත්තර ආයතනය සාක්ෂි දෙමින් මෙම ඉල්ලුම්කාරිය සම්මුඛ පරීක්ෂණය අසමත් වූ නිසා උසස්වීම් නොලැබුනු බව ද 2012 නව බඳවා ගැනීම් පටිපාටිය මත සහකාර අධ්‍යක්ෂක තනතුරු ලබා දිය නොහැකි බවද ප්‍රකාශ කර සිටී.

ඉල්ලුම්කාරියගේ ලිඛිත දේශන සාක්‍ෂි සහ වගඋත්තරකාර ආයතනයේ ලිඛිත දේශන සහ සාක්ෂි නිරීක්ෂණය කිරීමෙන් පසු විසඳිය යුතු මූලික ප්‍රශ්න කෙරෙහි අවධානය යොමු කළෙමි.

**1979 බඳවාගැනීමේ පටිපාටිය අනුව තනතුරු සඳහා සුදුසුකම්**

ලකුණු කරන ලද A7 සමග කොල හතරකින් යුත් සටහන් ( පිටු අංක 186, 187, 188, 189 )

1. මාණ්ඩලික සහකාර V වන ශ්‍රේණිය අභ්‍යන්තර බඳවා ගැනීම
   (අ) යටත් පිරිසෙහි කොමිෂන් සභා සේවයේ VI වන ශ්‍රේණියේ තනතුරක වර්ෂ 2 සේවා පලපුරුද්දක් තිබීම හෝ කොමිෂන් සභා සේවයේ VI,VII,VIII, ශ්‍රේණිවලින් එකක හෝ දෙකක හෝ තුනෙහිම වසර 6 ක සේවා පලපුරුද්ද

   (ආ) සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබීම.
2 සහකාර අධ්‍යක්ෂ IV වන ශ්‍රේණිය
   (අ) කොමිෂන් සභා සේවයේ V වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර තනතුරක වර්ෂ දෙකක සේවා කාලයක් සපුරා තිබීම හෝ කොමිෂන් සභා සේවයේ දෙවර්ෂයක සේවා කාලයක් සපුරා ඇති විශ්ව විද්‍යාලයක උපාධිදරයෙකු වීම.

   (ආ) සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබිය යුතුය.

ඉහත තනතුර සඳහා දක්වන සුදුසුකම් ඉල්ලුම්කාරියට තිබේ ද? ඉල්ලුම්කාරිය 1998 කොන්ත්‍රාත් ලිපිකරු ලෙස පුවත්පත් දැන්වීමකට කරන ලද ඉල්ලුම් පත්‍රයක් අනුව 1998.08.30. සිට උසාවි ලිපිකරු තනතුරට පත් වී ඇත.1999, 2000,2001 සේවා කාලය දීර්ඝ කර ඇති අතර 2004.04.30 දිනැති ලිපිය මගින් 2001.10.01 සිට VI වන ශ්‍රේණියේ උසාවි ලිපිකරු ලෙස ස්ථිර කර ඇත. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මගින් මාණ්ඩලික සහකාර V වන ශ්‍රේණිය සඳහා 2007.05.23 දින සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඇත. (A8) ඉල්ලුම්කාරියගේ කොන්ත්‍රාත් සේවා කාලයද සලකා බැලුවහොත් සේවා කාලය වසර 9 කි.ස්ථිර කළ දින සිට සේවා කාලය සලකා බැලුවහොත් VI වන ශ්‍රේණියේ සේවා කාලය වසර 5 යි මාස 7 කි. ඒ අනුව V වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර තනතුරට අවශ්‍ය මූලික සුදුසුකම් ඇත. සහකාර අධ්‍යක්‍ෂ තනතුර සඳහා V වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර තනතුරට වර්ෂ දෙකක සේවා කාලයක් තිබිය යුතුය. නමුත් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ උසස්වීම් දීමේ දී අනුගමනය කළ අවිධිමත් ක්‍රියාමාර්ග නිසා සහකාර අධ්‍යක්ෂක තනතුර ලැබීමට අවශ්‍ය මූලික සුදුසුකම් අහිමි වී ඇත.මේ අනුව ඉල්ලුම්කාරියට ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සේවා පලපුරුද්ද ඇති බව පිළිගනිමි.

ඉල්ලුම්කාරිය සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගි වී ඇති ද

ඉල්ලුම්කාරිය 2007,2009,2010 සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන ලද ලිපි A8,A9,A10 ලේඛන මගින් සනාථ කර ඇති අතර වගඋත්තරකාර ආයතනය මේ බව පිළිගෙන ඇත. වගඋත්තරකරුගේ සාක්ෂි සටහන් 104 පිටුව වගඋත්තර ආයතනය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතාගේ ප්‍රශ්න වලට ආයතනයේ සාක්ෂිකරු පිළිතුරු දෙමින්

ප්‍ර. ඒ මොන වර්ෂවලද කියල කියන්න සාක්ෂිකරු

පි. 2007, 2009,2010 වර්ෂවල

2007, 2009,2010 වර්ෂවල සම්මුඛ පරීක්ෂණ තොරතුරු සාක්ෂිකරු ඉදිරිපත් නොකළ අතර 2010 වර්ෂයේ සම්මුඛ පරීක්ෂණයේ තොරතුරු V2 ආයතනය මගින් ඉදිරිපත් කරයි.

මෙම සාක්ෂි අනුව ඉල්ලුම්කාරිය සම්මුඛ පරීක්ෂණවලට සහභාගි වූ බව තහවුරු වේ.

උසස්වීම් ලබාදීමේදී ඉල්ලුම්කාරියට අසාධාරණයක් වී තිබේ ද ?

2007 පැවති V වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර තනතුරට උසස්වීම් ලබාදීමේ දී සිදු වී ඇති අසාධාරණකම් එනම්,

1. ඉල්ලුම්කාරියට වඩා ජ්‍යෙෂ්ඨත්වයෙන් පහළ අයට උසස්වීම් ලබා දීම.
2. සුදුසුකම් නොමැති අයට උසස්වීම් ලබා දීම.
3. සම්මුඛ පරීක්ෂණයට සහභාගි නොවූ අයට උසස්වීම් ලබා දීම.

ඉහත අසාධාරණකම් පිළිබඳ ඉල්ලුම්කාරිය තම ලිඛිත දේශනවල 5,7,8,9,10,12,16 ඡේද මගින් සහ 2022.01.28 දින ඉදිරිපත් කරන ලද x ලේඛනය මගින් තහවුරු කර ඇත. එම ලේඛනය අනුව 2007.09.14 දින මාණ්ඩලික සහකාර V වන ශ්‍රේණියේ තනතුර ලැබූ ප්‍රදීප් කන්නන්ගර, අසංක සම්පත්, එස්. සුමිත්‍ර යන අය ඉල්ලුම්කාරියට වඩා ජ්‍යෙෂ්ඨත්වයෙන් පහළ වේ. මෙම ලේඛනයේ ප්‍රදීප් කන්නන්ගර VII වන ශ්‍රේණියේ ලිපිකරු තනතුරට 2002.03.15 පත්ව ඇති අතර 2007.09.14 දින V වන ශ්‍රේණියේ මාණ්ඩලික තනතුරට පත්කර ඇති අතර 2017.11.08 IV වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂක රාජකාරි ආවරණ තනතුරට පත් කර ඇත. මොහුට මාණ්ඩලික සහකාර උසස්වීමට සුදුසුකම වූ VI වන ශ්‍රේණියේ වසර දෙකක පළපුරුද්ද හෝ VI,VII,VIII ශ්‍රේණිවලින් එකක හෝ දෙකක හෝ තුනෙහිම වසර 6 ක සේවා පලපුරුද්දක් තිබී නොමැත.VII වන ශ්‍රේණියේ සේවා කාලය කොන්ත්‍රාත් කාලය ඇතුලත්ව අවු. 5 යි,මාස 3කි. එමෙන්ම සහකාර අධ්‍යක්ෂක තනතුරට අවශ්‍ය V වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර තනතුරේ වර්ෂ 2ක සේවා පළපුරුද්ද නොමැත. 2007 මාණ්ඩලික සහකාර තනතුරට පත් නිශාන්ත බණ්ඩාර VII වන ශ්‍රේණියේ සේවා කාලය අවු. 5කි. සහකාර අධ්‍යක්ෂක තනතුරට, මාණ්ඩලික සහකාර ශ්‍රේණියේ වර්ෂ 2ක පළපුරුද්දක් අවශ්‍ය වුවද නිශාන්ත බණ්ඩාර මහතාට තිබී ඇත්තේ මාස දෙකක පළපුරුද්දකි. x ලේඛනයේ (අංක 5) 2007.09.14 සහකාර අධ්‍යක්ෂක තනතුරට පත් A.G.M.A. බන්දු ගුණරත්න මහතාට V වන ශ්‍රේණියේ වර්ෂ 2ක පළපුරුද්දක් නොමැත. ඔහු VII වන ශ්‍රේණියේ ක්ෂෙත්‍ර නිළධාරියෙකි. එම ලේඛනයේ 2007.09.14 IV වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂක තනතුරට පත් අංක 2 හිමි නාමල් නාකන්දල මහතා 1998.12.01 දින කොන්ත්‍රාත් පදනම මත VII වන ශ්‍රේණියේ ලිපිකරු තනතුරට පත් වූ අයෙකි. මොහු ඉල්ලුම්කාරියට වඩා ජ්‍යෙෂ්ඨත්වයෙන් පහළ එමෙන්ම සහකාර අධ්‍යක්ෂක තනතුරට අවශ්‍ය V වන ශ්‍රේණියේ වසර දෙකක සේවා කාලයක් නොමැති අයෙකි. මෙම ලේඛනයේ අංක 1 හිමි තුෂාර ජයවර්ධන මහතාට 2007.01.02 දින මාණ්ඩලික සහකාර තනතුර ලබා දී ඇති අතර 2007.09.14 IV වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ තනතුර ලබා දී ඇත. සහකාර අධ්‍යක්‍ෂක තනතුරට අවශ්‍ය වන V වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර තනතුරේ වසර 2 ක පලපුරුද්ද නොමැති අතර ඔහුගේ සේවා කාලය මාස 6 කි. ඉල්ලුම්කාරියගේ 2019.12.23 දින ඉදිරිපත් කළ ලිඛිත දේශනයේ 7 වන ඡේදයේ (12, 13 පිටු) අංක 5 හිමි එස්. සුමිත්‍ර මහතා සම්මුඛ පරීක්‍ෂණයට පෙනී නොසිටි අතර ඔහු 2007 වර්ෂයේ V වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර තනතුරට උසස් කර ඇත. එම ඡේදයේ අංක 6 හිමි රෝහිණී කරුණාරත්න සම්මුඛ පරීක්‍ෂණයට කැඳවීමකින් තොරව V වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර තනතුර ලබා දී ඇත. ඉල්ලුම්කාරියගේ මෙම තොරතුරු අනුව 2007 පැවති සම්මුඛ පරීක්‍ෂණයේ දී මෙම ඉල්ලුම්කාරියට අසාධාරණයක් වී ඇති බවට තහවුරු වේ. වගඋත්තරකරුගේ 2020.01.30 දිනැති පිළිතුරු ප්‍රකාශනයේ 7(2) මගින් පිළිතුරු සපයා ඇත්තේ එම අය 2007.05.28 දිනැති ලිපිය මගින් කැඳවූ නිළධාරීන් අතරින් සම්මුඛ පරීක්‍ෂණය මගින් තේරී පත් වූ නිළධාරීන් බවය. මෙම ලේඛනයේ තුෂාර ජයවර්ධන මහතාට V වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර තනතුර ලබා දී ඇත්තේ 2007.01.02 දිනය. ඉල්ලුම්කාරිය මේ බව තම කාර්යසටහන් වල සිය නීතිඥ මහතාගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ප්‍රකාශ කර ඇත. කාර්යසටහන් 66,67

ප්‍ර. තම ස්ථාවරයක් තමා මහත්මියට එලෙස VI වන ශ්‍රේණියට ඉහළ උසස්වීමක් ලබා නොදුන්නද ආයතනයේ අනිත් අයට එලෙස උසස් වීම් ලබා දුන්නා කියන කාරණය ?

පි. පැහැදිලිවම ලබා දුන්නා.

ප්‍ර. මහත්මියට කියන්න පුළුවන් ද ඒ ආකාරයට VII,VI ශ්‍රේණියේ නිළධාරීන්ට මහත්මියට උසස්වීම් නොදී ඒ අයට උසස්වීමක් ලබා දුන්නා කියන කාරණය කියන්න පුළුවන් ද ?

පි. 7 ශ්‍රේණියේ 1996 වර්ෂයේ ලිපිකරුවෙකු වශයෙන් බැඳුනු තුෂාර ජයවර්ධන මහතා 2007 වර්ෂයේ දී ජනවාරි මස මාණ්ඩලික සහකාර තනතුරටද 2007 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ දී සහකාර අධ්‍යක්ෂක IV ශ්‍රේණියේ තනතුර ද ලබා දුන්නා. ඊට අමතරව මම සම්මුඛ පරීක්ෂණයට පැමිණි අවස්ථාවෙහි VI වන ශ්‍රේණියට මගේ නම කතා කළ IX වන ශ්‍රේණියේ සිටි කාර්යාල කාර්ය සහයක නිශාන්ත බණ්ඩාර මහතා 2001 වසරේ ලිපිකරු තනතුරට පත් වුණා. 2007 මාණ්ඩලික සහකාර

තනතුරට පත්වුණා. 2017 වර්ෂයේදී සහකාර අධ්‍යක්ෂක විශේෂ ව්‍යාපෘති රාජකාරී ආවරණ තකතුරට පත්වුණා. ප්‍රදීප් කන්නන්ගර මහතා 2002 වර්ෂයේදී කොන්ත්‍රාත් පදනම මත VII වන ශ්‍රේණියේ ලිපිකරු ලෙස පත්කරනු ලැබුවා. 2004 වසරේ ස්ථිර VII වන ශ්‍රේණියේ පත්වීම් ලබා ඒ මහතාට 2007 වර්ෂයේ V වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර තනතුර ලබා දුන්නා. ඊට අමතරව වන්නිආරච්චි මහතාට VII වන ශ්‍රේණියේ ක්ෂේත්‍ර නිළධාරිවරයෙක් 2007 වසරේ දී 4 වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂක ලබා දුන්නා. සුනිල් බණ්ඩාර මහතා VII වන ශ්‍රේණියේ ලිපිකරු 2007 වසරේ දී IV වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂක පත්වීම ලබා දුන්නා. තවත් අය ඉන්නවා.

ප්‍ර. ලිඛිත කරුණු ඉදිරිපත් කිරීමක් සිදු කළා 2019.12.23 වෙනි දා ?

පි. ඔව්.

ප්‍ර. එම ලිඛිත කරුණු ඉදිරිපත් කිරීම්වල 5 වන ජේදයේ ගරු අධිකරණයට කරුණු ඉදිරිපත් කරලා තියෙනවා ?

පි. ඔව්.

ප්‍ර. එම කරුණු සත්‍යයි කියා ගරු අධිකරණයට කියා සිටිනවා ද?

පි. ඔව්.

පි. එම ලිඛිත ප්‍රකාශයේ ම සඳහන් කරලා තියෙනවා 2007 වර්ෂයේ V වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර තනතුර සඳහා VI වන ශ්‍රේණියේ සිටි මා සුදුසුකම් සපුරා තිබිය දී මට වඩා අවම සුදුසුකම් VII වන ශ්‍රේණියේ නිළධාරීන්ට V වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර තනතුර ලබා දුන්නා කියලා සඳහන් කරලා තියෙනවා ?

පි. ඔව්.

ප්‍ර. එම නිළධාරීන් කවුද කියලා තියෙනවා ?

පි. ඔව්.

ප්‍ර. සත්‍ය කරුණු කියලා නැවතත් අධිකරණයට කියා සිටිනවා ද?

පි. මා විසින් සත්‍ය කරුණු ඉදිරිපත් කරලා තියෙන්නේ.

වග උත්තර ආයතනය 2020.01.30 දින ඉදිරිපත් කර තිබූ ලිඛිත දේශනයේ 4 වන ජේදය

"4 පැමිණිලිකාරිය එකී මාණ්ඩලික සහකාර V වන ශ්‍රේණිය සඳහා අයදුම්පත් යොමු කළ නමුත් අදාළ සම්මුඛ පරීක්ෂණයේ දී පැමිණිලිකාරිය (තවත් ඉල්ලුම්කරුවන් ගණනාවක් සමඟ) විසින් අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබීම නිසා එකී තනතුර සඳහා තෝරා ගෙන නොමැති බව සඳහන් කර ඇත". නමුත් මෙම කරුණ ඉල්ලුම්කාරියගේ ලිඛිත දේශන හා කාර්ය සටහන් අනුව පිළිගත නොහැකිය. ඉල්ලුම්කාරිය 2022.02.09 දින මෝසම් පතක් මගින් x ලේඛනයක් ඉදිරිපත් කර ඇත.

මෙම x ලේඛනය සම්බන්ධව වගඋත්තර පාර්ශවය (කාර්ය සාධන ගොනුවේ 158 වෙනි පිටුවේ අවසාන ජේදයේ)

"මෙම ඉල්ලීම සම්බන්ධයෙන් මට කරුණු ඉදිරිපත් කිරීමට කාලය අවශ්‍ය වෙනවා. අද දින මෙම සාක්ෂිකරු හරහා මෙම කියන ලේඛන හෝ තොරතුරු සම්බන්ධයෙන් සාක්ෂි ගොනු කරන්නේ නැහැ". මෙම නොතීසිය සම්බන්ධයෙන් මම ඉදිරියේ දී අවශ්‍ය කරුණු කාර්මික අධිකරණය ඉදිරියේ ගොනු කරනවා. ( වගඋත්තරකාර ආයතනයේ නීතිඥ මහතාගේ ප්‍රකාශනයකි. ) කරුණු පසුව ඉදිරිපත් කරන බව පැවසුවත් කිසිදු හබ කිරීමක් කර නොමැත. මෙම කරුණු විශ්ලේෂණය කිරීමේ දී සම්මුඛ පරීක්ෂණයේ දී ඉල්ලුම්කාරියට අසාධාරණයක් වී ඇති බව තහවුරු වේ.

ඉල්ලුම්කාරිය 2019.12.23 දින ගොනුකල ලිඛිත දේශනයේ 8 වන ජේදය "1995, 1996, 1997 හා 1998 වර්ෂවල VII වන ශ්‍රේණියට බඳවාගත් සේවකයින්ට ඉහත අංක 05 හා 07 වන ජේදවල සඳහන් පරිදි උසස්වීම් 2007 වර්ෂයේ දී ලබා දුන් අතර වසර 10ක් උසස්වීමක් නොමැතිව VII වන ශ්‍රේණියේ සිටින ලද සේවකයින්ට වැටුප් වර්ධක 3ක් සමඟ VI වන ශ්‍රේණියට අන්තර්ග්‍රහනය කිරීමට වගඋත්තරකාර ආයතනය තීරණයක් ගෙන තිබුණි. ඒ අනුව

1995 - 1996 හා 1997 හා 1998 යන වර්ෂවල ආයතනයට VII වන ශ්‍රේණියට බඳවාගත් සේවකයින්ගෙන් උසස්වීමක් නොබලා සිටි සේවකයින් ඉහත තීරණය අනුව වැටුප් වර්ධක 3 ක් සමඟ VI වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලදී".

එම අවස්ථාවේ දී 1998 වර්ෂයේ නොවැම්බර් මස VII වන ශ්‍රේණියට බඳවාගත් සේවකයින් ඉහත තීරණය අනුව අන්තර්ග්‍රහණය කරන ලදී. එහෙත් ඔවුන් වසර 10 ක් සපුරා නොතිබිණි. පැමිණිලිකාර මා 1998 වර්ෂයේ අගෝස්තු මස VI වන ශ්‍රේණියට බඳවාගත් වගඋත්තරකාර ආයතනය ඉල්ලුම්කාර මා වෙත කිසිදු අන්තර්ග්‍රහනයක් ලබාදීමට පියවර ගත්තේ නැත.

ඉහත කරුණු පිළිබඳ ආයතනය 2020.01.30 ගොනු කළ ප්‍රතිඋත්තර දේශනයෙන් ද සාක්ෂිකරුවන්ගෙන් ද පිළිතුරු සපයා නැත. එමගින් 2007 කරන ලද අන්තර්ග්‍රහනයේ දී ඉල්ලුම්කාරියට අසාධාරණයක් සිදු වී ඇත.

සම්මුඛ පරීක්ෂණවලින් උසස්වීම් නොලැබූ සෑම අවස්ථාවක දීම ඒ පිළිබඳ විමසූ බවත් වසරින් වසර බලාපොරොත්තු තබමින් සාධාරණයක් ඉටු නොකළ බව කියා සිටී. ඉල්ලුම්කාරිය වගඋත්තරකාර ආයතනයේ නීතිඥ මහතාගේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් (කාර්ය සාධන පිටු 85, 86, 87, 88, 89)

ප්‍ර. තමා දැන් තමයි අවුරුදු 13 කට පසුව තමයි සාක්ෂිකරු කියන්නේ 2007,2009,2010 වසරේ දී බඳවා ගැනීම වුනේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අභිමතය පරිදි ?

උ. නෑ ස්වාමීනි මම අභියාචනා ඉදිරිපත් කරලා තිබෙනවා. 2007 මම අභියාචනා ඉදිරිපත් කරලා තිබෙනවා.ඊට පසුව ආයතනය 2009 සම්මුඛ පරීක්ෂණය තිබුණු නිසා නිහඬ වුනා. 2009 නොදීපු නිසා 2011 ඉදිරිපත් වුනා 2011 නොදුන්න නිසා ආයතනය මට කිව්වා 2012 අන්තර්ග්‍රහනයේ දී මට සාධාරණයක් කරනවා කියලා. ඒ කාලය තුළ උසස්වීම් ළඟ ළඟ දීපු නිසා හා ඉන් පසුව අන්තර්ග්‍රහණයේදී මට සාධාරණයක් කරනවා යැයි කියපු නිසා මම නිහඬව බලාගෙන හිටියා. ආයතනය ගැන විශ්වාසය තියලා. ඒත් 2013 සිට 2019 වසර දක්වා ස්වාමිණි මම අභියාචනා ඉදිරිපත් කරලා තියෙනවා.

ප්‍ර. සාක්ෂිකාරිය මෙම සාක්ෂිය ලබා දෙමින් ඔය කියන අභියාචනා ඉදිරිපත් කරලා නෑ නේද මොනවත් ?

උ. අභියාචනා ඉදිරිපත් කරලා තිබෙනවා.

ප්‍ර. සාක්ෂිකාරිය මෙම සාක්ෂිය ලබා දෙන්නේ අධිකරණය ඉදිරියේ ඉදිරිපත් කරලා නෑ නේද?

උ. විමසීම් අවස්ථාවේ දී 2018 අගෝස්තු 01 තමයි මෙම පැමිණිල්ල මෙම ආයතනයට ඉදිරිපත් කරේ ඒ ආයතනයට ඉදිරිපත් කරපු දවසේ ඉඳලා මම පැමිණිල්ල විමසන අවස්ථාවේ ඉදිරිපත් කර තිබෙනවා.

ප්‍ර. සාක්ෂිකරු මේ අධිකරණයට අදල වෙන්නේ සාක්ෂිකරු දුන්න සාක්ෂිය නේද?

උ. ඔව්

ප්‍ර. සාක්‍ෂිකාරිය හොඳට කල්පනා කරලා හිතලා බලලා තමයි සාක්‍ෂිකරු මේ අධිකරණයේ දිවුරුමක් අරගෙන සාක්‍ෂි ලබා දෙන්නේ?

උ. ඔව්.

ප්‍ර. සාක්‍ෂිකරු දැන් කියන කතාව සාක්‍ෂිකරු මෙම අධිකරණය ඉදිරියේ ලබා දුන්න සාක්‍ෂි මත පැහැදිලි වෙන්නේ නෑ නේද?

උ. මම ඒක විමසන අවස්ථාවේ කියා තිබෙනවා.

ප්‍ර. මේ සාක්‍ෂියේ දී ලිඛිතව දීලා නෑ නේද ?

උ. එක අභියාචනාවක් මම සාක්‍ෂි සටහන්වල ලකුණු කර තිබෙනවා.

ප්‍ර. මොකක්ද ලේඛනය ?

උ. A13

ප්‍ර. A13 ලේඛනය සාක්‍ෂිකරු උසස්වීම් සම්බන්ධයෙන් අදාළ අභියාචනය කියලා දී තිබෙනවා. බලන්න තිබෙන දිනය කවද්ද?

උ. එහෙමයි.

ප්‍ර. අවුරුදු 10 කට පසුව

උ. ඔව්

ප්‍ර. සාක්ෂිකරුට අවුරුදු 10ක් යනකම් හිතුනෙ නැද්ද අභියාචනාවක් ඉදිරිපත් කරන්න.

උ. අභියාචනා මම ඉදිරිපත් කරා ස්වාමීනි. මම 2015 ඉදිරිපත් කරා 2012 අන්තර්ග්‍රහණයෙන් කුමක් කළේ ද යන්න මම දැනගත්තේ 2015 අන්තර්ග්‍රහණයට අදළ ලිපිය නිකුත් කළේ 2015. 2015 ලිපිය ලද පසුව එතැන් සිට මම නැවත ලියන්න පටන් ගත්තා. අභියාචනා හිටපු සභාපතිවරුන්ට දුන්නා. හැම සභාපතිවරයෙකුටම මම අභියාචනා දුන්නා.

ප්‍ර. මම සාක්ෂිකරුට ඉස්සෙල්ලා කිව්වේ සාක්ෂිකරු කියනවා අවුරුදු ගණනාවක් තිස්සේ අභියාචනා ඉදිරිපත් කරලා කියලා. මම සාක්ෂිකරුට කියනවා මෙම අධිකරණය ඉදිරියේ ඉදිරිපත් කර තිබෙන්නේ එක් අභියාචනයක් විතරයි. එය 2017.02.20 දී අභියාචනයක්, ඒ අභියාචනය ඔය කියන 2007 මුල් බඳවා ගැනීමේ සිට අවුරුදු 10 කට පසුව සාක්ෂිකාරිය කර තිබෙන අභියාචනයක් කියලා.

උ. අධිකරණයට ඉදිරිපත් කරේ මෙම අභියාචනය විතරක් උනාට මීට පෙර දීපු අභියාචනාත්, මීට පසු දීපු අභියාචනාත් තිබෙනවා.

ප්‍ර. එතකොට සාක්ෂිකාරිය දන්නවා ද සාමාන්‍යයෙන් සාක්ෂිකරු අභියාචනයක් ඉදිරිපත් කරාම (උදාහරණයක් වශයෙන් 2017 වර්ෂයේ අභියාචනය ගමු) සාක්ෂිකරු දන්නවාද 2017 වසරේ මෙම ඉදිරිපත් කර තියෙන අභියාචනය සම්බන්ධයෙන් මෙම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මේ ඉල්ලා තිබෙන සහනය ලබා දෙන්න ඕන නම් ඒ ඉල්ලා තිබෙන සහනය ලබා දෙන්න පුළුවන් දැනට පවත්නා නීතිය සම්බන්ධයෙන් කියලා?

උ. නැත ස්වාමීනි 2017 වර්ෂයේ ආයතනය සහකාර අධ්‍යක්ෂක වැඩ බලන තනතුරු ගණනාවක් ලබා දුන්නා. 2018 වසරෙත් ගණනාවක් ලබා දුන්නා. 2018 වසරේ සහකාර අධ්‍යක්ෂක රාජකාරී ආවරණය ලබා දුන්න නිසා මා වෙත ද සාධාරණයක් ඉටු කිරීමට ආයතනයට ඉඩ තිබුණා. ඒ නිසා තමයි හිටපු සභාපතිතුමා වන සම්පත් සුබසිංහ ආරච්චි මහතා මට සහකාර අධ්‍යක්ෂක රාජකාරී ඉටු කරන තනතුර ලබා දෙන ලෙසට ලිඛිත නියෝගයක් අධ්‍යක්ෂක ජනරාල්තුමා වෙත දුන්නා. එයත් ක්‍රියාත්මක කළේ නෑ.

ප්‍ර. සාක්ෂිකරු අධ්‍යක්ෂක ජනරාල්තුමා විසින් ලිඛිත නියෝගයක් දුන්නා කියලා ඔබ කිව්වා නේ ද?

උ. ඔව්.

ප්‍ර. ඒ දුන්න ලිඛිත නියෝගය සාක්ෂිකාරිය ඉදිරිපත් කර තිබෙනවා ද?

උ. 2018.08.22 දින සභාපතිතුමා වෙත අභියාචනයක් ඉදිරිපත් කරාට පසුව සභාපතිතුමා 2017.02.24 වන දින වාර්තාවක් ඉල්ලුවා මම අවුරුද්දක් බලාගෙන ඉඳලා 2018.06.08 දින සභාපතිතුමාට ලිව්වා. ඔබතුමා නියෝගයක් ලබා දුන්නා වාර්තාවක් දෙන්න කියලා නමුත් අවුරුද්දක් ගත උනත් කිසිම අංශයකින් මේ ගැන කිසිදු කටයුත්තක් සිදු නොකරන ලදී. ඒ නිසා මේ සම්බන්ධයෙන් මා වෙත සහනයක් ලබා දෙන්න කියලාත් ඒ මගේ 2018.06.08 දිනැති ලිපියට සභාපතිතුමා මාත් ඉදිරියේම සහකාර අධ්‍යක්ෂක රාජකාරී ඉටුකිරීම තනතුර ලබා දෙන්න අධ්‍යක්ෂක ජනරාල් කියලා ලිඛිත නියෝගයක් දුන්නා. ඒ ලිපිය සභාපතිතුමාගේ කාර්යාල කාර්ය සහයකතුමා මාත් එක්ක ලියුමක් අරගෙන අධ්‍යක්ෂක ජනරාල්තුමාගේ කාමරයට ගියා. අධ්‍යක්ෂක ජනරාල්තුමාට ඒ ලිපිය දුන්නා. ඒ දුන්න වෙලාවේ අධ්‍යක්ෂක ජනරාල්තුමා කිව්වා " මාස දෙකක් තුනක් මිස් ඉවසන්න මේකට මොනවා හරි සාධාරණයක් මම කරනවා" කියලා. මම ඒකට එකඟ වුනේ නැහැ. මම කිවුවා " සර් මම අවුරුදු 20ක් ඉවසුවා. මම අධිකරණමය කටයුත්තක් සඳහා එළියට කකුල තියන්න මේ සූදානම් වෙන්නේ. " මට බොහොම සැර විදිහට කතා කරලා " යන්න එපා උසාවි ගියොත් මම තමයි එන්නේ ෆයිල් එක අරගෙන " කිවුවා. සර් එන්න මගේ ෆයිල් එක අරගෙන ආයතනයේ කවුරු හෝ නිලධාරියෙක් එන්න අවශ්‍යයි. කමක් නැහැ සර් එන්න. මම අධිකරණයට යනවා කියලා ඒ ලියුම අධ්‍යක්ෂක ජනරාල්තුමා ලාච්චුවට දාගත්තා. සභාපතිතුමා ඊට කලින් ඒ වගේම මීට පෙර උසස්වීම්, රාජකාරී ඉටුකිරීම් දුන්න අවස්ථාවල දී ඒ සියලු පත්වීම් අධ්‍යක්ෂ ජනරාල්තුමා දුන්නා. මට විතරයි මේ දේ කළේ. පැහැදිලිවම මම කියනවා 2010 වර්ෂයේ අභියාචනා ඉදිරිපත් වූ බව වගඋත්තරකාර ආයතනයේ සාක්ෂිකරු පිළිගනී. ( කාර්ය සටහන් 106 )

ප්‍ර. ඒ අභියාචනාව ඉදිරිපත් කරලා තියෙන්නේ 2010 වර්ෂයේ ?

පි. ඔව්.

ප්‍ර. ඒ අභියාචනාව ඉදිරිපත් කළ පසුව ඒ අභියාචනා කමිටුව විසින් යම් කිසි නිර්දේශයක් කරලා තියෙනවා ද ?

පි. ඔව්.
සාක්ෂිකරුට ලේඛනයක් පෙන්වා සිටී.

ප්‍ර. මෙම ලේඛනය බලලා කියන්න ඒ අදාළ නිර්දේශය මොකද්ද කියලා ?

පි. මෙතන තියෙනවා මාණ්ඩලික සහකාර තනතුරට ඉදිරිපත් කළ නිලධාරීන්ගේ නම්. එහි නම් 7 ක් ඇතුලේ 5 වෙනි නම විදිහට තියනවා ප්‍රියානි මල්කාන්ති මහත්මිය එහි අවසානයේදී නිර්දේශයක් විදිහට තියෙනවා අභියාචනා කමිටුව විසින් මේ සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලද අතර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ලබාදී ඇති තීරණයන් සාධාරණ වන බැවින් නැවත ප්‍රතිඵල සංශෝධනයක් අවශ්‍ය නොවන බැවින් අභියාචනා සියල්ල ඒකමතිකව ප්‍රතික්ෂේප කරන ලදී.

වගඋත්තරකරුවන් එසේ සඳහන් කළ ද ඉල්ලුම්කාරියගේ කාර්ය සටහන් අනුව (62 පිටුව)

ප්‍ර. මහත්මිය 3 වතාවක් ම සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වෙනවානේ ඒත් එක් අවස්ථාවකදීවත් මහත්මිය සමත් වෙලා තනතුරු ලබා දීමට කටයුතු කලේ නැද්ද ?

පි. ආයතනය කටයුතු කලේ නෑ. නමුත් 2007 වසරේ දී සම්මුඛ පරීක්ෂණය යථා පරිදි වුනේ නෑ. 2009 දී තමන් කැමති අයට උසස් වීම් ලබා දුන්නා. වගඋත්තර ආයතනයේ කැමැත්ත මත අපි සම්මුඛ පරීක්ෂණයට කැඳෙව්වාට 2010 සම්මුඛ පරීක්ෂණයට මම ඉදිරිපත් වුනු වෙලාවේ ජනාධිපති කාර්යාලයෙන් එතනට පැමිණ සිටියා සමන් වඩුගේ කියලා මහත්මයෙක්. එතන දී මාත් එක්ක කතා කළා 1998 ඉඳන් ඉන්න නිසා කලින් උසස්වීමක් නොදුන්නේ ඇයි කියලා විමසුවා පාලන අංශයෙන්. මැඩම් ඒ කාලයේ නොසිට බැවින් ඒ ගැන කියන්න දන්නේ නැහැ කිව්වා. ජනාධිපති කාර්යාලයෙ සර් කිව්වා මේ සැරේවත් උසස්වීමක් දෙන්න කියලා. මට පැහැදිලිවම දැනුම් දුන්නා මම නිර්දේශ කරනවා කියලා සතුටින් යන්න කියලා. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ දී මට ප්‍රකාශ කළා. ඒත් මට ඒ උසස්වීම් ලබා දුන්නේ නැහැ.

මෙහි දී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සිටි නිලධාරීන් අභියාචනා කමිටුවට නියෝජනය කර ඇද්ද යන්න විමසා බැලිය යුතුය. ඉල්ලුම්කාරියගේ නීතිඥ මහතාගේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් වගඋත්තරකාර ආයතනයේ සාක්ෂිකරු අභියාචනා කමිටුවේ සංයුතිය පහත පරිදි ප්‍රකාශ කර ඇත. (කාර්ය සාධන 130 පිටුව)

ප්‍ර. ඒ අභියාචනා සියල්ල ඒකමතිකව ප්‍රතික්ෂේප කරන ලදී කියල විධායක අධ්‍යක්ෂක සහ අධ්‍යක්ෂක කළමණාකරන මානව සම්පත් සහ අධ්‍යක්ෂක තක්සේරු සහ චන්දි අත්සන් කරලා තියෙනවා.

පි. ඔව්.
සම්මුඛ පරීක්ෂණයේ සංයුතිය පිළිබඳව (කාර්ය සාධන වාර්ථා 134 පිටුව)

ප්‍ර මහත්මයාට මම කියා සිටින්නේ මේ පරිපාලන ව්‍යවස්ථා සංග්‍රහය අනුව V2, V3 ලේඛන අනුව මෙම පත්වීම් සම්බන්ධයෙන් විධායක අධ්‍යක්ෂකවරයාට ඒ පිළිබඳ කිසිදු කාර්යක් කිරීමට බලතලයක් නැහැ කියලා මම මහත්මයාට යෝජනා කරනවා ?

පි. මෙතන මේ සම්මුඛ පරීක්ෂණයට සභාපතිතුමා වශයෙන් නම් කරල තිබෙනවා විධායක අධ්‍යක්ෂකතුමා ඇතුළු තවත් සාමාජිකයන් දෙදෙනෙක්. එතකොට සම්මුඛ පරීක්ෂණයේ ප්‍රධානියා විදියට අධ්‍යක්ෂකතුමා නම් කරල තිබෙන්නේ
මේ අනුව සම්මුඛ පරීක්ෂණයේ නිලධාරීන්ට අභායාචනා කමිටුවේ කටයුතු කිරීම සාධාරණ සහ යුක්ති සහගත නොවේ.
ඉල්ලුම්කාරියට සිදු වූ අසාධාරණය සම්බන්ධයෙන් යම් සහනයක් සැලසුවහොත් එය 2012 නව බඳවා ගැනීම් පටිපාටිය අනුව බාධාවක් වේ දැයි සලකා බැලිය යුතු ය. ඉල්ලුම්කාරියගේ ලිඛිත දේශනයේ 12 වන ඡේදය අනුව 2017,2018 වර්ෂවල සහකාර අධ්‍යක්ෂක තනතුර සඳහා උසස්වීම් ලබා දී ඇත. ඒ සම්බන්ධව වගඋත්තරකාර ආයතනයේ ලිඛිත දේශනවල (29 පිටුව) 7(iii) මගින් ප්‍රකාශකර ඇත්තේ මාණ්ඩලික සහකාර තනතුරේ සේවයේ යෙදී සිටින නිලධාරීන් කිහිප දෙනෙකුට රාජකාරි අවශ්‍යතාවය මත 2018 වර්ෂයේ දී සහකාර අධ්‍යක්ෂක විශේෂ ව්‍යාපෘති ලෙස තාවකාලිකව රාජකාරි ආවරණය කිරීම සඳහා පත්කර ඇති බවත්ය.

නමුත් එම අය තවමත් සේවය කරන බව ඉල්ලුම්කාරිගේ නීතිඥ මහතාගේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් (කාර්‍ය්‍ය සාධන වාර්ථා 142)

ප්‍ර. එතකොට වැඩ බැලීමේ පත්වීමක් කරන්න ඕනෙ තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණයි.

පි. ඔව්.

ප්‍ර. දැන් මහත්මයා ඉදිරිපත් කරපු බඳවා ගැනීම් සහ උසස් කරන ලද එම නිලධාරි මහත්වරු අවුරුදු 4 ක් 5 ක් තිස්සේම එම වැඩ බැලීම සහ වැඩ ආවරණය කරනවා අදටත් කරනවා ?

පි. පිරිසක් කරනවා. පිරිසක් අදටත් ඉන්නවා. මට මතකයි පත් කරපු 6 දෙනෙක් වගේ පිරිසගෙන් දැනටත් 2ක් ද කොහෙ ද අදටත් රාජකාරි ආවරණය කරනවා.

එමෙන්ම ඉල්ලුම්කාරියගේ ලිඛිත දේශනයේ 16 ඡේදය අනුව වගඋත්තර ආයතනය 2019.02.26 දින 10551 දරන කොමිෂන් සභා වාර්තාව මගින් නියෝජ්‍ය අධ්‍යක්‍ෂක තනතුරු පත්වීම් 10ක් අනුමත කර ඇත. එහි දී 1979 බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන ද අදාළ කරගෙන ඇත. මේ සම්බන්ධව වගඋත්තර ආයතනයේ නීතිඥ මහතාගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ආයතනයේ සාක්ෂිකරු (කාර්ය සාධන වාර්තා 110 පිටුව)

ප්‍ර. ඔය ලේඛනය බලලා කියන්න මේ උසස්වීම් දෙන්නේ මොන කාර්ය පටිපාටියට අනුව ද?

පි.. 2012 නව කාර්ය පටිපාටියට අනුව

ප්‍ර. එතකොට සාක්ෂිකරු ඒ අදාළ වන්නේ නව කාර්ය පටිපාටියට අනුව ද?

පි. 1979 බඳවා ගැනීමේ පටිපාටියක් යම් මට්ටමකින් අදාළ කරගෙන තියෙනවා.

නඩු අංක A3322 ඉඩම් ප්‍රතිසංස්කරණ සභාව විරුද්ධ උදුලා ඉන්ද්‍රානි දොඩංගොඩ බේරුම් කරන නඩුවේ දී දෙන ලද ප්‍රදානය මත උසස් වීම් 2013 වර්ෂයේ ලබා දී ඇත. ඉහත කරුණු අනුව මෙම ඉල්ලුම්කාරියට යම් සහනයක් සැලසීම 2012 නව බඳවා ගැනීම් පටිපාටිය උල්ලංඝනය වීමක් නොවේ. මෙම ආයතනය පත්වීම් හා උසස්වීම් ලබා දීමේ දී නීත්‍යානුකූල ක්‍රමවේදයක් අනුගමනය කර තිබේ ද විමසිය යුතුව ඇත. මෙම ආයතනයේ 1979 බඳවා ගැනීම් පටිපාටිය මත ලබා දී ඇති අතර අදාළ ඉල්ලුම්කාරිය A.16 ලෙස ලකුණු කර ඇති පරිපාලන ව්‍යවස්ථා සංග්‍රහය සියලු බඳවා ගැනීම් සඳහා පටිපාටිය ප්‍රකාශයට පත් කළ යුතු බව දැක්වේ.

**පරිපාලන ව්‍යවස්ථා සංග්‍රහය 19**

"ව්‍යවස්ථා 13 (1) (2) හෝ (3) ප්‍රකාර පත් කිරීම් සිදු කිරීම් කළ යුතු වූ විට කොමිෂන් සභාව විසින් නිසි පරිදි නම් කරනු ලබන තේරීම් මණ්ඩලයක් විසින් අපේක්ෂකයින් උචිත සංඛ්‍යාවක් සම්මුඛ පරීක්‍ෂණයට භාජනය කළ යුතුය. සභාපතිවරයාට සම්මුඛ පරීක්‍ෂණය අවසන් වීමෙන් පසුව සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලය විසින් ස්වකීය අදහස පරිදි ඉතා හොඳින් තේරී ඇති අපේක්ෂකයින්ගේ නාම ලේඛනයක් ඔවුන්ගේ කුසලතාව අනුව පිළියෙල කොට ස්වකීය නිර්දේශයන් ද සමග සභාපතිවරයා විසින් ස්වකීය නිරීක්ෂණයන් ඉදිරිපත් කරමින් IV ශ්‍රේණියට සහ ඉන් ඉහළ ශ්‍රේණියට කළයුතු පත්කිරීම් සම්බන්ධයෙන් නම් කොමිෂන් සභාවේ ඊළඟ රැස්වීමේ දී අනුමැතිය ලබා ගත යුතු වේ. V වන ශ්‍රේණියේ හා ඉන් පහළ ශ්‍රේණිවල කරනු ලබන පත් කිරීම් සම්බන්ධයෙන් නම් සභාපතිවරයා විසින් ම එය අනුමත කළ යුතුවේ. පත් කළ යුතු අපේක්ෂකයන්ගේ නම සහ ලිපිනයන් සභාපතිවරයා විසින් අධ්‍යක්‍ෂක (පාලන) වෙත දන්වනු ඇත. ඉන් ඉක්බිති අධ්‍යක්‍ෂක (පාලන) විසින් පත්කිරීම් ලිපි නිකුත් කළ යුතුවේ. දෙන ලද උසස්වීම් සඳහා ඉහත ක්‍රමවේදය අනුගමනය කර ඇති බවට වගඋත්තර ආයතනය සහතික කර නැත. දෙන ලද උසස්වීම් දින වකවානු අධ්‍යයනය කිරීමේ දී නිසි ක්‍රමවේදයක් අනුගමනය කර නොමැති අතර බඳවා ගැනීම් පටිපාටියේ ඒ ඒ තනතුරු සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් පවා උල්ලංඝනය කර ඇත. X ලේඛනය අනුව 2007 වර්ෂයේ V වන ශ්‍රේණිය උසස් කිරීමට 2007.05.23 සම්මුඛ පරීක්‍ෂණ කැඳවා ඇතත් VII වන ශ්‍රේණියේ ලිපිකරුව සිටි තුෂාර ජයවර්ධන නමැති අයට 2007.01.02 V වන ශ්‍රේණිය මාණ්ඩලික සහකාර තනතුර දී ඇත. IV වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්‍ෂක තනතුර සඳහා V වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර තනතුරක සේවා කාලයක් තිබිය යුතු වුවද ඉහත අයට V වන ශ්‍රේණියේ මාස 8 ක සේවා කාලයකින් පසු IV වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්‍ෂක තනතුර ලබාදී ඇත. එන්. වන්නිආරච්චි නමැති VII වන ශ්‍රේණියේ ක්ෂේත්‍ර නිලධාරී මහතෙකුට 2007.05.24 දින සහකාර අධ්‍යක්‍ෂක (වැඩ බලන) දී ඇත. 2007.09.14 දින සහකාර අධ්‍යක්‍ෂක ස්ථිර කර ඇත. එමෙන්ම 2012 නව බඳවා ගැනීම් පටිපාටිය අනුමත වූ දිනෙන් පසු සියලු බඳවා ගැනීම් හා උසස් වීම් එම බඳවා ගැනීම් පටිපාටිය අනුව කළ යුතුවුවත් 2018, 2019 වර්ෂවල දෙන ලද උසස් වීම් 1979 බඳවාගැනීම් පටිපාටිය පදනම් කරගෙන දී ඇත. ඒ අනුව උසස් වීම් හා පත්වීම් දීමේ වූ විධිමත් ක්‍රමවේදයක් මෙම ආයතනය අනුගමනය කර නැත.

සමස්ත සාක්ෂි සටහන් සහ සළකුණු කරන ලද ලේඛන සලකා බැලීමේ දී මෙම ඉල්ලුම්කාරිය.
1998.08.03 කොන්ත්‍රාත් පදනම මත උසාවි ලිපිකරු ලෙස වගඋත්තරකාර ආයතනය බඳවා ගෙන ඇත. 2001.10.01 දින සිට VI වන ශ්‍රේණියේ උසාවි ලිපිකරු ලෙස ස්ථිර කර ඇත. මෙම ස්ථිර කළ දිනයේ සිට උසස්වීම් දීමේ පටිපාටිය අනුව 2003.10.01 වන විට V වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර තනතුරට සුදුසුකම් ලබයි. 2005.10 මාසය වන විට බඳවා ගැනීම් පටිපාටිය අනුව සහකාර අධ්‍යක්‍ෂක තනතුරට සුදුසුකම් ලබයි. බඳවා ගැනීම් පටිපාටිය අනුව උසස් වීම් ලැබුනානම් ඉල්ලුම්කාරිය උසස් තනතුරක සිටිය යුතුය.

1995.06.01 දින සිට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ VII ශ්‍රේණියේ ලිපිකාරිනියක ලෙස සේවය කළ උදුලා ඉන්ද්‍රානි දොඩංගොඩ මෙනවියට ශ්‍රේණිගත උසස්වීම් ලබා නොදීම පිළිබඳව බේරුම්කිරීමට යොමු කළ A3322 නඩුවේ ප්‍රදානය පිළිබඳ අවධානය යොමු කළෙමි. එම ප්‍රදානය මගින් 1997.06.01 දින සිට ලැබිය යුතු ශ්‍රේණි ලබා දී අදාළ වැටුප් තලවල පිහිටුවා ඇත.

ඉල්ලුම්කාරිය 2009.12.23 දින ලිඛිත දේශනයේ අවසානයේ (17 පිටුව)

තවද ඉල්ලුම්කාර මා ඉතා කරුණාවෙන් ඉල්ලා සිටින්නේ

I ඉල්ලුම්කාර මා පත්වීම් ලද දින සිට වර්ථමානය දක්වාම (වසර 21) කිසිඳු උසස්වීමක් හෝ අන්තර්ග්‍රහනයක් නොමැතිව රාජකාරි කටයුතු කරන බැවින් පැරණි බඳවා ගැනීමේ පටිපාටියේ නියමයන් අදාල කරගනිමින් උසස්වීම් ලබා දෙන ලෙසත්,

II එම උසස්වීම්වලට අදාළ වැටුප්, වැටුප් වර්ධක හා හිඟ වැටුප් හා ඊට අදාළ සියලුම ගෙවීම් මා වෙත ලබා දෙන ලෙසත් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ලිඛිත දේශන හා සාක්ෂි සටහන් අනුව ඉල්ලුම්කාරියට උසස්වීම් නොදීමට දක්වා හේතුවන, අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබීම වැටුප් පරිමානය ආසන්නයට පැමිණ සිටිම හා 2012 නව බඳවා ගැනීමේ පටිපාටිය අනුව පුරප්පාඩු නොමැති වීම යන කැරුණු ප්‍රතික්ෂේප කරමි. සමස්ත සාක්ෂි සටහන් අනුව කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 1998.08.03 දින සිට VI වන ශ්‍රේණියේ උසාවි ලිපිකාරිණියක් ලෙස පත්වීම් ලද එස්. ප්‍රියානි මල්කාන්ති මර්තීනු මහත්මිය වර්ථමානය දක්වාම උසස් වීම් නොලබා සේවය කිරීම නිසා ඇයට අසාධාරණයක් සිදුව තිබේ ද ? යන්නට පිළිතුර ඔව්.
අසාධාරණයක් සිදු වී ඇත්නම් ඇයට ලැබිය යුතු සහන මොනවා ද යන්න පහත දැක්වේ.
2001.10.01 සිට ස්ථිර කළ දිනය සලකා මාණ්ඩලික සහකාර ශ්‍රේණියේ සම්මුඛ පරීක්ෂණයට 2007.05.23 සහභාගී වී ඇත.
ඒ අනුව සහනය මෙසේය,

2001.10.01 සිට VI වන ශ්‍රේණියේ උසාවි ලිපිකරු ලෙස ස්ථිර පත්වීම් ලැබූ ඉල්ලුම්කාරිය මාණ්ඩලික සහකාර V වන ශ්‍රේණියේ සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ අයට පත්වීම් දිනය වන 2007.09.17 දින සිට V වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර තනතුර ලබා දී ඊට අදාළ වැටුප් තලයේ පිහිටු වීමද VI වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂක තනතුරට සුදුසුකම් ලැබූ 2009.09.17 සහකාර අධ්‍යක්ෂක තනතුරේ පිහිටුවා එකී සියලු තනතුරු සඳහා අදාළ වැටුප් තලයේ පිහිටුවීම ද ඉන් පසු වර්ෂ 3 ක් ඉක්මවීමෙන් පසුව බඳවාගැනීමේ පටිපාටිය අනුව ලැබිය යුතු නියෝජ්‍ය අධ්‍යක්ෂක තනතුරු පුරප්පාඩු පවතීනම් ලබා දීමටත් අදාළ වැටුප් තලයේ පිහිටුවීමත් ඉල්ලුම්කාරියට ලබා දිය යුතු සහනයන් ලෙස නිර්දේශ කරමි.
මෙම ප්‍රදානය යුක්තිසහගත හා සාධාරණ බව සහතික කරමි. මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වී මාසයක් ඇතුලත ඉටු විය යුතු යැයි නිගමනය කරමි.

H.R.L සුගතදාස
කාර්මික අධිකරණය බේරුම්කාර මණ්ඩලයේ සාමාජික
2022 ජූනි මස 16 වැනි දින

EOG 08-0243

---

මගේ අංකය: IR/COM/01/2017/116.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2019.04.03 දිනැති හා අංක 2117/33 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.03.26 දින දරන නියෝග යෙන්, එක් පාර්ශවයක් වශයෙන් රාගම, හීන්කෙන්ද, අංක 497/1/ඒ හි පිහිටි මිහින් ලංකා සේවක සංගමය ( ප්‍රධාන සංවිධායක ආර්. ඒ. එස්. ලයනල් ප්‍රේමසිරි මහතා ඇතුළු සේවකයින් 49 දෙනෙක්) සහ කොළඹ 02, ඩබ්. ඒ. ඩී රාමනායක මාවත, අංක 61, ඊ. එම්. එල්. ගොඩනැගිල්ල හි පිහිටි මිහින් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.07.07 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 අගෝස්තු මස 08 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ කාර්මික අධිකරණයේ දී ය

මිහින් ලංකා සේවක සංගමය,
අංක 497/1/ඒ,
හීන්කෙන්ද,
රාගම.

පළමුවැනි පාර්ශවය

එදිරිව

නඩු අංකය: A 34/2019

IR/COM/01/2017/116

මිහින් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්,
ඊ. එම්. එල්. ගොඩනැගිල්ල,
අංක 61,
ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

දෙවන පාර්ශවය

**වර්ෂ 2022 ක් වූ ජූලි මස 07 වැනි දින දීය.**

<u>බලතල පැවරීම.</u>

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මහතා වෙත 1957 අංක 14, 1957 අංක 62, 1962 අංක 04 හා 1968 අංක 39 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත්වලින් සංශෝධිත ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් ආරවුල බේරුම් කිරීම සඳහා මා වෙත පවරා තිබේ.

<u>පවත්නා කාර්මික ආරවුලේ ස්වභාවය.</u>

මිහින ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ සේවකයන් සේවයෙන් ඉවත් කිරීමේදී 2016 - 03 - 08 දිනැතිව මුදල් අමාත්‍යාංශය මගින් හඳුන්වා දී ඇති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 2/2016 පරිදි රාජ්‍ය ව්‍යවසායන් හි අතිරික්ත සේවකයන් සඳහා වන ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමය අනුගමනය නොකර එයට අඩු වෙනත් ක්‍රමයක් අනුගමනය කිරීමෙන් උපලේඛනයේ සඳහන් සේවකයන් හතළිස් නව දෙනාට අසාධාරණයක් සිදුවී තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔවුන් එකිනෙකාට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳ වේ.

<u>පාර්ශවයන්ගේ කරුණු දැක්වීම.</u>

1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ අංක 39 දරන වගන්තිය යටතේ හා 1959 මාර්තු මස 02 දිනැති අංක 11688 දරන රජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 1969 කාර්මික ආරවුල් පනත යටතේ වූ නියෝග සංග්‍රහයේ 21 (1) දරන නියෝගයෙන් දැක්වෙන පරිදි මෙකී ආරවුලට හේතු වී ඇති කරුණු පිළිබඳව එක් එක් පාර්ශවයන්ගේ ලිඛිත ප්‍රකාශයන් නඩු විභාගයට පෙරාතුවම ඉල්ලා සිටිය ද පළමු පාර්ශවය විසින් එය ඉදිරිපත් කළ ද දෙවන පාර්ශවය එය ඉදිරිපත් කිරීමට කටයුතු කර තිබුණේ නැත. දෙවන පාර්ශවය වෙත යොමු කරන ලද සියලු ලිපි ආපසු හරවා එවා තිබිණි. මේ සම්බන්ධයෙන් පළමු පාර්ශවය වෙතින් නැවත අවස්ථා කිහිපයකදීම නිවැරදි ලිපිනයක් ඉල්ලා සිටීම මත ඉදිරිපත්ව තිබූ ලිපිනයන් වෙතද ලිපි යොමු කළත් ඒවාද ආපසු හරවා ඒවා තිබිණ. එම නිසා තවදුරටත් නඩුව විභාගයට ගැනීම ප්‍රමාද කළ නොහැකි බැවින් නඩු විභාගය සඳහා සහභාගී වන ලෙස දන්වමින් දෙපාර්ශවය වෙතම ලිපි යොමු කිරීමට කටයුතු කරන ලදී. මේ ආකාරයෙන් අවස්ථා කිහිපකදීම පාර්ශවයන් නඩු විභාගය සඳහා කැඳවූව ද දෙවන පාර්ශවය එක් දිනක් හෝ ඊට සහභාගී වූයේ නැත. එපමණක් ද නොව මෙසේ කැඳවීම් කරන ලද සෑම අවස්ථාවකම අදාළ ලිපිය ආපසු හරවා එවා තිබිණ.

ඉන් ඉක්බිතිව 2022 ක් වූ පෙබරවාරි මස 17 වැනි දිනැති ලිපියක් මගින් දැනුම් දී තිබුණේ මිහින් ලංකා පෞද්ගලික සමාගම ඈවරකර ගණන් බේරා වසා දැමීමට අධිකරණ නියෝගයක් ලැබී තිබෙන බවය. සාමාන්‍යයෙන් ඈවර කිරීමක දී හා ඊට අදාළ ඈවරකරුවන් පත් කිරීමේ දී රජයේ *ගැසට් පත්‍රයේ* ඒ පිළිබඳව දැන්වීමක් පලකළ යුතුව තිබෙන බැවින් එම *ගැසට්* නිවේදනය පරීක්ෂා කර බලා අවසාන වශයෙන් තීරණයක් ගැනීමට සිදුවිය. 2007 අංක 07 දරන සමාගම් පනතේ 320 (1) වගන්තිය යටතේ කිසියම් සමාගමක් ඈවරකර ගණන් බේරා වසා දැමීමකදී ඒ බව දින 14 ක් ඇතුළත ගැසට් ගත කළ යුතුව තිබේ. එමෙන්ම පනතේ 346 (1) වගන්තිය ප්‍රකාරව ඈවරකරුවන් පත් කිරීමකදී එසේ පත් කර දින 14 ක් ඇතුළත ඒ පිළිබඳව ද රජයේ *ගැසට් පත්‍රයේ* පළකිරීම පවත්නා නෛතික තත්ත්වයයි. එවැනි අවස්ථාවක දී එකී සමාගමේ අධ්‍යක්ෂකවරුන්ගේ බලතල අවසන් වන බව පනතේ 326 (2) වගන්තිය ප්‍රකාශ කරයි. තවද පනතේ 274 හා 279 යන වගන්තීන්ට අනුව එවැනි සමාගමකට එරෙහිව නඩු පැවරීමට හෝ නඩු කටයුත්තක් පවත්වාගෙන යාමට හෝ දිසා අධිකරණයේ පූර්ව අවසරය ලබාගත යුතුව තිබේ.

ඒ කෙසේ වෙතත් පවත්නා තත්ත්වය මෙය බැවින් හා 2007 අංක 07 දරන සමාගම් පනතේ 326 (2) වගන්තිය ප්‍රකාරව දෙවන පාර්ශ්වයට අයත් සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩල බලතල අවසන්ව පවත්නා බැවින් නඩු කටයුතු සඳහා ඔවුන් කැඳවා ගැනීමට බේරුම්කරුවෙකු වෙත බලතල හිමි වී නැත. අධ්‍යක්ෂක මණ්ඩලය සතු නොවන බලයක් වෙනත් නියෝජිතයෙකුට පැවරීමට ද හැකියාවක් නැත.

<u>ප්‍රදානය</u>

සමාගමක් ඈවරකර ගණන් බේරා වසා දැමීමකදී පවත්නා නෛතික තත්ත්වය මෙය බැවින් මා වෙත යොමු කර ඇති ආරාවුල සම්බන්ධයෙන් කිසිදු ප්‍රදානයක් මින් ලබා නොදෙමි.

ලොරා සුමතිපාල,
බේරුම්කරු.

AA/34/2019

උපලේඛනය

01. රුවන්පුර අන්දිරිස් සිල්වලාගේ ලයනල් ප්‍රේමසිරි
02. ලූලියන් කිංග්ස්ෆෝඩ් ඩේමියන් පෙරේරා
03. ජූඩ් වොලන්ස් ෆීලික්ස් බචෝ
04. කෞෂලා ඉරෝමි සිල්වා
05. සෙල්වරාජ් ක්‍රිෂාන්ත්
06. නිර්මලා අයිරාංගනී ප්‍රනාන්දු
07. බාලසූරියගේ ශානිකා තුෂානි සේනාසේකර
08. හෙට්ටිආරච්චිගේ සිසිල් ප්‍රේමරත්න
09. හෙට්ටිආරච්චිගේ උපුල් රෝහන
10. ජයවික්‍රම උපනන්ද ලියනගේ
11. මල්නයිද මරකල අනෝම සිරිසේන
12. ෆ්‍රැන්සිස්කු හේවගේ ජයන්ත ප්‍රේමසිරි
13. මහගෙදර විතානගේ නිල්මිණි කුමාරි
14. ජනක ප්‍රසාද් සුහසිංහ
15. සොහාන් ඩේන්මන්ඩ් කුරුෂාන්ත වර්ණකුලසූරිය
16. තරංග ලක්සිරි ගුනරත්න
17. අබ්දුල් කාදර් මොහොමඩ් හාඩීල් ෂෙහාම්
18. දළුන්ඩගේ තිලාන් ලසන්ත වික්‍රමසේකර
19. වික්‍රමසූරිය ආරච්චිගේ අසේල මාදව බංඩාර
20. තෙන්නකෝන් මුදියන්සේලාගේ කලන උපසංක තෙන්නකෝන්
21. තිලින ජීවන්ත වික්‍රමසිංහ
22. හික්කඩුවගේ දිනේස් ලක්සාන් රොඩ්රිගෝ
23. හේවා ගජනායක පත්තිනිගේ පුෂ්පාන්ජලී සමන්තා රමණී
24. සමන්ත මෛත්සිරි අබේරත්න සේනානායක

25. දොන් සුරේන් ආලෝක හෙට්ටිආරච්චි
26. මොහොමඩ් රාශික් මොහොමඩ් නෆීල්
27. මෙරෙන්චි කංකානම්ගේ දිලාන් චමින්ද
28. දිසානායක මුදියන්සේලාගේ උදයංග පුෂ්පකුමාර දිසානායක
29. වික්‍රමතිලක වෙදආරච්චිගේ ජයසංක චන්දන උදයරත්න
30. රණසිංහ ආරච්චිගේ නුවන් කාන්ත රණසිංහ
31. නලවන්තගේ ටර්නිල් අරුනසිරි නලවත්ත
32. කොස්වත්ත පතිරැන්නැහේල්ගේ නාලක ගුණවර්ධන
33. ගමගේ ඉසුරු ප්‍රියංකර
34. සුහදිනී සිතාරා පූජිත ගුණවර්ධන
35. ගලගෙදරගේ ඉරොෂ් නිරංග
36. කළුබෝවිලගේ දසුන් මලින්ද ප්‍රනාන්දු
37. උඩුනුවරගේ නයෝමි රංගිකා විජේවර්ධන
38. කණිෂ්ක අතුකෝරාළ
39. දිසානායක මුදියන්සේලාගේ සාවින්ද සුනේත් දිසානායක
40. දියඋල්ලගේ අරුනෝදා රණසිංහ
41. යටිදෙමාවක ගෙදර සජිත් චතුරංග පීටර්
42. දුනුමාල රාජපක්ෂගේ උදරි විදුෂිකා රාජපක්ෂ
43. හේවාකපුගේ ගිහාන් අසංක කුමාර
44. වර්ණකුලසූරිය නිවාඩ් ඇන්ඩ්‍රො ප්‍රනාන්දු
45. ජයකොඩි ආරච්චිලාගේ ඩීමා මයෝන් ජයකොඩි
46. හොරතලගේ අස්මි නුවන් සෙනවිරත්න
47. ජයකොඩිආරච්චිගේ දේශාන් විමුක්ති ජයකොඩි
48. කංචකඩුගේ මනූෂා නිශානි ප්‍රනාන්දු
49. එස්. එල්. ඩී. ආර්. ප්‍රනාන්දු

EOG 08 - 0244

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.